


මට හතළිහක් කියලා මං හිතන්නේ නැහැ
ෂාරුක් ඛාන්

නොවැම්බර් දෙවනිදා හින්දි පුරයේ සුපිරි නළු ෂාරුක් ඛාන්ට සුවිශේෂ දවසක්. ඒ ෂාරුක්ගේ 40 වෙනි උපන් දිනය එදිනට යෙදී තිබුන නිසා. ෆෝටි නෝටි කියලා කියනවා නේ. ඒ මේ සුපිරි නළුවට ෆෝටි නෝටි වෙන එකක් නැහැ. එයට හේතුව මේ සුපිරි නළුවා වටා එක්රොක් වෙන පිරිස එන්න එන්නම වැඩිවීමක් 2006 මාර්තු මාසයේ පැවැත්වෙන ෆිල්ම් ෆෙයාර් සම්මාන උළෙල සඳහා ෂාරුක් රගපෑ සාර්ථක චිත්‍රපටි කිහිපයක් සම්මාන ලැබීම සඳහා ඇතුළත් විමයි. චිත්‍රපටි සඳහා ඔහුට ලැබෙන ආරාධනා වලින් අඩුවක් නැහැ.
අවුරුදු හතළිහක් කියලා මට නම් පොඩ්ඩක්වත් හිතෙන්නේ නැහැ. මට නම් සාමාන්‍ය දෙයක්. මට අවුරුදු තිහ පහුවුණා වගේම තමයි හතළිය පසුවිමත් ෂාරුක් හිනැහෙමින් පවසයි.

ඇත්තටම නළුවෙකුට තමන්ගේ වයස වටිනවා. කොහොමද අපි වයසට ගියේ කියලා හිතන්න.
(ෂාරුක් කියන්නේ එහෙමයි )

මෙහෙම හිතන්න. සාමාන්‍යයෙන් මිනිසුන් තමන්ගේ පින්තූර දවසින් දවස ගන්නේ නැහැ. කාලෙකින් ගන්න පින්තූරය අතර වෙනස හොඳට පේනවා. ඒත් නළු නිළියන්ගේ පින්තූර නිතර නිතර ගන්නවා. ඉතිං වයස ගැන වෙනසක් හිතන්න අපිට කාලයක් නැහැ.

**ෂාරුක් ඔබ හිතනවද ඔබගේ වයස පේන්නේ නැහැ කියලා?**
( සිනාසමින් ) මම දන්නේ නැහැ මගේ වයස පේනවද කියලා. සමහරු කියනවා පහේලි වල වයසලූ. මමත් ඒ බව දැක්කේ චිත්‍රපටිය නරඹද්දී. හුඟක් අය නළු නිළියන්ගේ වයස ගැන සැලකිළිමත් වන බව මම දැනගත්තේ එහිදී ලැබුණු ප්‍රතිචාර වලින්.

අවුරුදු හතළිහක් කියලා මම හිතන්නේ නැහැ වගේම මට හතළිහක් පෙනෙනවා කියලත් මගේ හිත පිළිගන්නේ නැහැ.

**ෂාරුක් ඔබගේ වෘත්තීය ජීවිතය ගැන කතා කළොත් ?**

ඔගේ වෘත්තීය ජීවිතයට දැන් අවුරුදු පහළොවක්. මම මේ වෘත්තීය ජීවිතයෙන් ලොකුම ජයග්‍රණයක් ලබාගෙන තිබෙනවා. ඒ තමයි මේ දක්වා රසික රසිකාවියන්ගේ ආදරය නොකඩවා ලබා ගැනීම.

8

මේ වෘත්තීය ජීවිතය තුළ මම රඟපෑම කවදාවත්
තරගයක් කරගෙන නැහැ. දක්ෂ නළුවෙක් වෙන්න මිසක් සුපිරි තරුවක් වෙන්න මට අවශ්‍ය නැහැ. ඇත්තටම ෂරුක් ඛාන් කියන පිළිගැනීමට මම ආදරෙයි. ඒ ගියාම තමයි මට හොඳ ගෙදරක් , සැප පහසු වාහනයක් සුන්දර ජීවිතයක් ලැබුණේ. ඒක මට අමතක කරන්න බැහැ. ඔබ විශ්වාස කරන්න. අද මට පුළුවන් කැමති චිත්‍රපටියක් ලොකුම ලොකු තිරයක ගෙදර ඉඳලා බලන්න. සාප්පුවකට ගිහිල්ලා මුදල් ගැන නොහිතා කැමති යාගදම බඩුවක් මිලට ගන්න. සාදයක් වගේ දෙයකදි අත දිග ඇරලා වියදම් කරන්න, හැබැයි මම මේ ලොකුකතා කරනවා කියලා නම් ඔබ හිතන්න එපා.

**අමිතාබ් බච්චන් ප්‍රවීණ නළුවෙක්. ඔහු ඔබ සුපිරි නළුවෙක් යයි ප්‍රකාශයක් කර තිබුණා. මේ පිළිබඳව ඔබ හිතන්නේ කොහොමද?**

මම හැදුනේ වැඩුනේ මිස්ටර් බච්චන්ගේ චිත්‍රපටි බලමින් ඔබ දන්නවද ? මම වතාවක් ඔහු වගේ වෙනවා නම් කියලත් හිතිලා තිබෙනවා. මම ඉස්සර නොවරදවාම මිස්ටර් බච්චන් ගැන විස්තරයක් තිබුණොත් කියවනවා. මට හිතාගන්න බැහැ මිස්ටර් බච්චන්ගේ කාරුණික බව පිළිබඳව. හැබැයි මම ඒ ප්‍රකාශය තදින් හිතන්න යන්නේ නැහැ. නමුත් අමිතාබ් බච්චින් කියන්නේ මගේ ලෝකයේ වීරයෙක්. හැබැයි ඔහුගේ ප්‍රකාශය ගැන එක දෙයක් කියන්නම්. ඔහු ආවාට ගියාට වචන පාවිච්චි කරන කෙනෙ-ක් නොවෙයි. අමිතාබ් කියන්නේ හින්දි සිනමාවේ සුපිරි තරුව නැත්නම් යෝධ තරුව. ඔහු වැනි දැවැන්තයෙක් වීම මට නම් සිහිනයක් වගේ.

**පහේලී චිත්‍රපටිය ඔස්කාර් සම්මාන සඳහා නියෝජනය වීම ඔබට දැනුනේ කොහොමද?**
ඇත්තටම මම පුදුම වුණා. හොඳම චිත්‍රපටියක් ඔස්කාර් සඳහා යැවිය යුතුයි. ඒ අතින් පහේලී හොඳ බව ඔබටමත් වැටහෙනවා නේද? ඒ ගියාම සිතට දැනුනේ පුදුම සතුටක්.

ඔබ ආදරණීය පියෙක්. ඔබ කැමතිද ඔබේ පුතා ආර්යන් ඔබ වගේ වෙනවා දකින්න?
පුතාගේ පෙනුම මට වඩා හොඳයි. ඔහුගේ මට ගැළපෙන දේවල් වගේම නොගැළපෙන දේවලුත් තිබෙනවා. ඒක ස්වභාවයක්. ඔහු නළුවෙක් වේවි කියලා හිතන්න පුළුවන් ලක්ෂණත් තිබෙනවා. ඒත් හරියටම කියන්න බැහැ. මම කැමතියි මගේ පුතා මං වගේ වෙනවට. හැම තාත්තා කෙනෙක් වගේම මමත් කැමතියි මගේ පුතයි දුවයි කරදරවලින් තොරව ජීවත් වෙනවා දකින්න. ඒ පරිසරය මම ඔවුන්ට හදලා දීලා තිබෙනවා. එය සාර්ථකව පවත්වාගෙන යාම තිබෙන්නේ ඔවුන් අතේ.

**ෂාරුක් ඔබ ඉන්නේ සතුටින්ද කියලා මං ඇහැව්වොත්?**

ඇයි ඔබ එහෙම අහන්නේ ඇත්තෙන්ම මං සතුටින්.

කසුන් අනුරංග

